**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය 2013**

---

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්රමයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්රකාශනය සහ මුදල් ප්රවාහ ප්රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/11 දරන ශ්රී ලංකා ප්රජාතාන්ත්රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් ප්රසිද්ධ කරන ලද ශ්රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්රම රෙගුලාසිවල 10.3 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්රී ලංකා ප්රජාතාන්ත්රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්රියාත්මක කරන බවට මෙම ප්රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත්

පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අරමුණු

-----------------------------------------------------------------------------------------

මුදල් නීති පනතේ (422 අධිකාරය) 32 ඊ වගන්තිය යටතේ මුදල් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිහිටුවන ලද අතර, රටෙහි සමස්ත මූල්‍ය ස්ථාවරත්වය පැවැත්වීම සහ මූල්‍ය ආයතන අසාර්ථක වීමෙන් කුඩා තැන්පතුකරුවන් ආරක්ෂා කරගැනීම සඳහා මූලික යාන්ත්‍රණයක් පිහිටුවීම තුලින් කුඩා තැන්පතුකරුවන්ගේ විශ්වාසය වර්ධනය කිරීමෙන් මූල්‍ය ආයතනවල ස්ථාවරත්වය තහවුරු කරගැනීම සඳහා ක්‍රියාත්මක කළ එහි මෙහෙයුම් 2010 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරම්භ කරන ලදි. රටෙහි සමස්ත මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සහ මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය තවදුරටත් වැඩිකිරීමට, එමගින් ද්‍රවශීලතා අනුග්‍රහය ලබා ගත හැකි බව ප්‍රසිද්ධ කිරීමට 2013 නොවැම්බර් 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය , " ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය'' යනුවෙන් නැවත

නම් කර තිබුණි. ඉහත රෙගුලාසිවල 7.1 ඡේදය ප්‍රකාර මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල පිහිටුවන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය, ආදායම් බද්දට පෙර රු. බිලියන 5.3 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු. බිලියන 4.29 හා සැසඳීමේදී අතිරික්තයේ රු. බිලියන 1.01 ක හෙවත් සියයට 23 ක වැඩිවීමක් දැක්විනි.

### 3.2 අරමුදල් තත්ත්වය

--------------------

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, ඉකුත් වර්ෂය අවසානය හා සැසඳීමේදී 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී

ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල රු. බිලියන 5.01 කින් හෙවත් සියයට 67 කින් වැඩිවී තිබුණි.

**3.3 මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.3.1 ආදායම් බදු දඩ**

**------------------**

2010 ඔක්තෝබර් 01 සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ ආදායම් බදු ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් රු.110,348,442 ක මුදලක්, දඩ ලෙස යෝජනා ක්‍රමයෙන් අයකර තිබුණි. යෝජනා ක්‍රමය එහි ආරම්භයේ සිටම එයට අදාළවන බදු රීතීන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පැහැදිළි කරගෙන තිබූ බව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති කරුණු ඉදිරිපත් කර තිබුණි. 2010 ඔක්තෝබර් 01 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අයකළ දඩ සමග බදු තක්සේරුවක් හා 2013 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන පරිදි බදු නිදහසක් ලබා දී තිබුණි.

**3.3.2 මුදල් ප්‍රවාහ**

**-------------**

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව, මුදල් ගලාඒම් හා ගලායාම් වෙනම හෙළිදරව් කිරීම වෙනුවට ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ ලෙස දක්වා තිබුණි.